බෙදුම් නඩුවකට අදාළ විභාගයට නියම කිරීමට පෙර කාර්ය පටිපාටිය.

(Pre Trial Steps)

Manjula Karunarathna – District Judge -Hambantota

අප රටේ වර්ථමාන බෙදුම් නඩු කාර්ය පටිපාටිය 1977 අංක 21 දරණ බෙදුම් නඩු පණත ප්‍රකාරව ක්‍රියාත්මක වන අතර, ඒ යටතේ යම් ඉඩමක් අයිතිකරුවන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට හවුලේ අයිතිය ඇති අවස්ථාවකදී එම ඉඩම බෙදා වෙන් කරවා ගැනීම හෝ විකිනීම සඳහා ඒ කවර හෝ අයිතිකරුවකු විසින් නැතහොත් අයිතිකරුවන් වැඩි සංඛ්‍යාවක් විසින් ඔහුගේ හෝ ඔවුන්ගේ අයිතිය වෙනත් යම් තැනැත්තෙකුගේ ජීවිත බුක්තියට යටත්ව තිබුනද, නොතිබුනද ඒ යටතේ බෙදුම් නඩුවක් පැවරීම සිදු කල හැකි වේ.

ඒ අනුව බෙදුම් නඩුවක් දිසා අධිකරණයක් වෙත ඉදිරිපත්ව ඇති අවස්ථාවකදී සිවිල් නඩු විධාන සංග්‍රහයේ 40 සහ 45 වගන්ති වල සඳහන් පැමිණිල්ලක ඇතුළත් විය යුතු අංගවලට අමතරව බෙදුම් නඩුවකට අදාලව ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලක් යටතේ බෙදුම් පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව වන විස්තර එකී පැමිණිල්ලෙහි අන්තර්ගත කල යුතු වන අතර, පැමිණිල්ල සමඟ පහත ලේඛණ ඉදිරිපත් කර තිබිය යුතු වේ.

අ. ඉඩමේ විස්තර සඳහන් වන කටු සටහනක් සිතියමක් හෝ පිඹුරක් .(භෞතික ඉම් සළකුණු සඳහන් කිරීමෙන් ඉඩම උපලේඛණයක් යටතේ විස්තර කර ඇත්නම් එයද ප්‍රමාණවත් වේ.)

ආ. පෙලපත් සටහනක්.

ඇ. පැමිණිලිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයෙක් පත් කරමින් ඉදිරිපත් කර ඇති 81 වන වගන්තිය යටතේ වූ ලියවිල්ලක්.

ඈ. පිටපත් තුනකින් සමන්විත වූ ලිස්පෙන්ඩනයක් .

ඒ යටතේ ඉහත කී ලේඛණ සමග පැමිණිල්ල ඉදිරිපත් වන ලද විටෙක අදාළ විෂයභාර ලිපිකරු විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා අඩුපාඩු නොමැති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව දිසාවිනිසුරු වෙත අදාළ නඩු ගොනුව ඉදිරිපත් කල යුතු වන අතර, (අඩුපාඩු වේනම් ඒ යටතේ පණතේ 07 වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කල යුතුය) ඒ යටතේ අධිකරණය විසින් පැමිණිල්ල භාර ගැනීමෙන් අනතුරුව ලිස්පෙන්ඩනය තුල නඩුවේ අංකය සඳහන් කර ආපසු එවිය යුතු දිනය වශයෙන් පැමිණිල්ල භාරගත් දින සිට <u>සති 07 ක් නොඉක්මවන දිනයක්</u> නියම කල යුතු වන අතර, එම අවස්ථාවේදීම මුල් මැනීම සඳහා ඇස්තමේන්තු කල ගාස්තුව තැන්පත් කල යුතු දිනය වශයෙන් එම දිනය සඳහන් කල යුතු වේ.

(මෙහිදී පැමිණිල්ල භාරගත් දින සිට සති දෙකක් ඉකුත් වීමට ප්‍රථම ලිස්පෙන්ඩන්ස් ලියා පදිංචියට යැවිය යුතුවේ)

ඉන් අනතුරුව ලිස්පෙන්ඩනය ලියා පදිංචි වී අධිකරණයට වාර්තා ලැබීමෙන් පසුව හා ඇස්තමේන්තු කල ගාස්තුව තැන්පත් කල පසුව මුල් මැනීමේ කොමිසම සමග බෙදුම් පනතේ 12 (1), 12 (2) වගන්ති යටතේ පියවර ඉදිරිපත් කිරීමට පැමිණිල්ල වෙත නියම කල යුතු වන අතර, එලෙස ඉහත කී ප්‍රකාරව පියවර ඉදිරිපත් කල පසු මුල් මැනීමේ කොමිසම පණතේ 16 (3) වගන්තිය ප්‍රකාරව දැන්වීම් (සිතාසි) සමග මානකවරයා වෙත නිකුත් කර 12 (2) වගන්තියේ සඳහන් ලේඛණ පිස්කල් හා ග්‍රාම නිලධාරි වෙත නිකුත් කරමින්, විත්තිකරුවන් වශයෙන් පැමිණිල්ලෙන් නම් කොට ඇති විත්තිකරුවන් වෙත අධිකරණය මගින් සිතාසි නිකුත් කල යුතුය.

12 (2) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු ලේඛණ,

i. **12 (1) වගන්තිය ප්‍රකාරව කරන ලද පරීක්ෂාවේදී තව දුරටත් පාර්ශ්වයන් වශයෙන් නම් කල යුතු පාර්ශ්වයන් සිටීනම් එම අයවලුන් පාර්ශ්වයන් වශයෙන් නම් කිරීම යටතේ වන සංශෝධිත පැමිණිල්ලක්.**

ii. **විත්ති සිතාසි , විත්තිකරුවන් අතුරින් කිසිවෙකුගේ භාෂාව අධිකරණයේ භාෂාව නොවන්නේ නම් විත්ති සිතාසි හා පැමිණිල්ලේ පරිවර්ථන**

iii. **මානකවරයා වෙත යැවීම පිණිස පැමිණිල්ලේ සත්‍ය පිටපතක් වන බවට ලේඛණ ගත නීතිඥ විසින් සහතික කරන ලද පිටපතක්.**

iv. **අදාල ඉඩමේ ප්‍රදර්ශනය කිරීම පිණිස (අවශ්‍ය වන විටෙක පරිවර්ථනද සමග) දැන්වීමක් (ඉඩම් සංඛ්‍යාව අනුරූපව) සහ පිස්කල් අණකරය**

v. **ග්‍රාම නිළධාරි වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා යැවිය යුතු ඉඩමේ ප්‍රදර්ශනයට යවන ලද දැන්වීමේ පිටපතක් (ඉඩම් සංඛ්‍යාවට අනුරූපව)**

ඒ යටතේ මුල් මැනීමේ කොමිසම අධිකාරිපත්‍රලාභියා විසින් කරන ලද ඉල්ලීමක් අනුව හා වාර්තා ගතකල යුතු හේතු මත අදාල මුල් මැනීමේ කොමිසම ඉදිරිපත් කල යුතු දිනය, දින 60 ක් නොඉක්මවන පරිදි අධිකරණය විසින් දීර්ඝ කල හැකි අතර, ඒ යටතේ මුල් මැනීමේ කොමිසම අධිකරණය වෙත ලැබීමෙන් අනතුරුව එය සලකා බැලීමට පාර්ශ්වයන් වෙත අවස්ථාව ලබාදී, බෙදුම් පනතේ 16 (2) , 18 (3) හෝ 19 (2) වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් ඉදිරිපත්ව නොමැත්තේ නම්, මුල් මැනීමට අදාළ මූලික පිඹුර ස්ථිර කිරීමක් සිදු කොට විත්තිකරුවන්ගේ හිමිකම් ප්‍රකාශ ගොනු කිරීම සඳහා නියම කරලීමෙන් අනතුරුව රෙජිස්ට්‍රාර් වාර්තාවක් කැඳවා (විභාගයට නියම කිරීමට පෙර ගත යුතු සියලු පියවර ගෙන ඇත්තේ දැයි තහවුරු කර ගැනීම සඳහා) නඩුව විභාගයට නියම කිරීම සඳහා (Call to fix for Trial) කැඳවිය යුතු වන අතර, ඒ යටතේ බෙදුම් පනතේ 24 වන වගන්තිය සමග එක්වගෙනකියවිය යුතු 19 (3) වගන්තිය ප්‍රකාරව විභාගය සම්බන්ධයෙන් දැන්වීම් යැවිය යුතු පාර්ශ්වයන් වෙත විභාග දිනය සම්බන්ධයෙන් දැන්වීම් සිදු කොට ඒ අනුව නඩුව විභාගය සඳහා නියම කල යුතු වේ.

ඒ අනුව කරුණු සළකා බැලීමේදී බෙදුම් නඩුවක නඩු විභාගයට ප්‍රථම අධිකරණය විසින් මූලික වශයෙන් තැබිය යුතු ජර්නල් සටහන් පහත සඳහන් පරිදි වේ.

01. i. පැමිණිල්ල භාර ගනිමි.

ii. ලිස්පෙන්ඩනය ලියා පදිංචියට යවන්න.

iii. මුල් මැනීමේ ඇස්තමේන්තු ගාස්තු ගෙවූ බවට ලදුපත ඉදිරි දිනට ඉදිරිපත් කල යුතුය. (සති 07 ක් නොඉක්මවන දිනයක් ඒ යටතේ සදහන් කල යුතුයි.)

02. i. ලිස්පෙන්ඩනය ලියා පදිංචි වී අධිකරණය වෙත ලැබී ඇත.

ii. මුල් මැනීමේ ඇස්තමේන්තු ගාස්තු තැන්පත් කල බවට ලදුපත ගොනු වී ඇත.

iii. බෙදුම් පනතේ 12 (1), 12 (2) වගන්ති යටතේ වන පියවර ඉදිරිපත් කරන්න.

(මාස 01 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ සදහන් කල යුතු වේ)

03. i. පනතේ 12 (1) සහ 12 (2) වගන්ති පියවර ඉදිරිපත් කොට ඇත.

ii. මුල්මැනීමේ කොමිසම ඉදිරිපත් කරයි. නිකුත් කර වාර්තා කැදවන්න.

(මාස 02 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ ලබාදිය යුතුය.)

04. i. මූලික පිඹුර ඉදිරිපත් කොට ඇත.(මූලික පිඹුර ඉදිරිපත් කිරීම සඳහා

මානකවරයා විසින් දිනයක් අයද ඇත්නම්, අවස්ථාවෝචිතව දින 60 ක් නොඉක්මවන දිනයක් ලබාදිය හැක)

ii. භිග මැනුම් ගාස්තු ඉදිරි දිනට .

iii. විත්තිකරුවන් වෙත සිතාසි සහ 12 (2) වගන්ති ප්‍රකාරව සෙසු පියවර නිකුත් කර වාර්තා කැදවන්න.

iv. මූලික පිඹුර සළකා බැලීම ඉදිරිදිනට

(මාස 02 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ ලබාදිය යුතු වේ)

05. i. මූලික පිඹුර සම්බන්ධයෙන් විරෝධතා ඇත/නැත.(ඒ අනුව ඉදිරි නියෝගය)

ii. චිත්තිකරුවන්ගේ හිමිකම් ප්‍රකාශ ඉදිරි දිනට

(මාස 02 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ ලබාදිය යුතුය)

06. i. චිත්තිකරුවන්ගේ හිමිකම් ප්‍රකාශ ගොනුකර ඇත. ගොනුකර නොමැති පාර්ශ්වයන පැහැර හැරි පාර්ශ්වයන් ලෙස නම් කල යුතුය.

ii. රෙජිස්ට්‍රාර් වාර්තාව ඉදිරි දිනට (සියලු පියවර විධිමත්ව ගෙන ඇති බව තහවුරු කර ගැනීම පිණිස)

(මාස 02 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ ලබාදිය යුතු වේ)

07. i. රෙජිස්ට්‍රාර් වාර්තාව ඉදිරිපත් කර ඇත.(මේ යටතේ 12(2) වගන්ති ප්‍රකාරව ගොනුකර පිස්කල් වෙත සහ ග්‍රාමනිළධාරි වෙත යවන ලද ලේඛණ නිසි පරිදි ප්‍රසිද්ධ කර ඇත්දැයි යන්න සහ සියලු කාර්ය පටිපාටික පියවරයන් නිසි පරිදි ගෙන ඇත්දැයි සළකා බලා තහවුරු කරගත හැකිවේ)

ii. විභාගයට නියම කිරීම සදහා කැදවන්න.(මාස 01 ක් නොඉක්මවන දිනයක් මේ යටතේ ලබාදිය යුතු වේ)

08. i. විභාගයට දින නියම කිරීම.

(ඉහත කී ප්‍රකාරව කටයුතු කිරීම යටතේ අතුරු නියෝග නොමැති වාතාවරණයක් තුල නඩුව පවරා වර්ෂයක් තුල බෙදුම් නඩුවක් විභාගයට ගැනීමේ හැකියාව, අධිකරණය වෙත හිමිවන අතර, ඒ යටතේ එක් එක් පියවරට අදාළව නැවත දින පතනු ලබන අවස්ථාවකදී සති 02 ක් නොඉක්මව අවසාන දිනයන් ඒ සදහා ලබාදී අදාල පියවර කඩිනමින් ගොනු කරවා ගැනීමට පියවර ගත යුතුය.)

බෙදුම් නඩුවක් විභාගයට ගැනීමට පෙර කාර්ය පටිපාටිය

(1 වන වගන්තියේ සිට 24 වන වගන්තිය දක්වා) සම්බන්ධයෙන් වන වැදගත් කරුණු

1) තම අයිතියට අදාලව ජීවත බුක්තිය වෙනත් යම් පාර්ශවයක් සතුව පැවතියද නොබෙදු හවුල් අයිතිකරුවෙකුහට බෙදුම් නඩුවක් පැවරිය හැක. (Section 2 of the Partition Act)

2) බෙදුම් නඩුවක් පැවරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වන වගන්තිය අදාල නොවන අතර ඉඩමේ පිහිටීම පමණක් අධිකරණ බලය යටතට වැටේ. (Section 3 of the Partition Act)

3) බෙදුම් නඩුවක් සම්බන්ධයෙන් විෂය වස්තුවෙහි අණ බෙර ගස්සවා වාචිකව ප්‍රකාශ කල යුතු අවස්ථා 2කි.

   (අ) පිස්කල්වරයා විසින් පනතේ 15(3) වගන්තිය ප්‍රකාරව - මේ යටතේ ඉඩමෙහි පමණක් නොව ඉඩමට නුදුරු ප්‍රසිද්ධ ස්ථානයකදීද අණබෙර ගැස්සවීමෙන් වාචිකව ප්‍රකාශ කල යුතුය.

   (ආ) මිනින්දෝරුවරයා විසින් පනතේ 17(2) වගන්තිය ප්‍රකාරව

4) බෙදුම් නඩුවක පැවතිය හැක්කේ එක් මූලික මැනීමේ පිඹුරක් (Preliminary plan) පමණක් වන අතර, ඒ සඳහා අධිකාරි පත්‍රය ලබන මිනින්දෝරුවරයා (අධිකාරිපත්‍ර ලාභියා/ කොමසාරිස්) ලෙස හැදින්වේ.

5) කිසියම් චිත්තිකරුවෙකු චිත්තිවාචකයක් ලෙස පැමිණිල්ලේ සඳහන් ඉඩම විෂය වස්තුව නොවන බව පෙන්වා දීම සඳහා වඩා විශාල ඉඩමක් හෝ කුඩා ඉඩමක් මැනීමට අවශ්‍ය බව පනතේ 16 (2) වගන්තියේ ප්‍රතිපාදන මත අයැද සිටිය හැකි අතර, ඒ යටතේ එකී විශාල හෝ කුඩා ඉඩම මැන ඒ මත මූලික පිඹුර අධිෂ්ඨාපනය කිරීම සඳහා කොමසාරිස්වරයා වෙත (මූලික පිඹුර සකස් කල මිනින්දෝරුවරයා වෙත) අධිකාරි පත්‍රය යොමු කල යුතුය.

6) බෙදුම් පනතට 1987 අංක 32 දරණ සංශෝධන පනත මගින් 16 (3) සිට 16 (6) දක්වා අළුතින් වගන්ති 4ක් හඳුන්වා දෙනු ලැබ ඇති අතර ඒ අනුව කොමසාරිස්වරයා (අධිකාරිපත්‍ර ලාභියා) විසින් මුල් මැනීමේදී ඒ වන විට නඩුවේ පාර්ශවයන් නොවන කිසියම් පුද්ගලයෙකු විසින් නඩුවට අදාල ඉඩම සම්බන්ධයෙන් යම්කිසි හිමිකම් පෑමක් ඉදිරිපත් කර සිටින අවස්ථාවකදී බෙදුම් පනතේ දෙවන උපලේඛනයේ ආකෘතිය(මෙය සිතාසියකි) ප්‍රකාරව පැමිණිලිකරු විසින් මුල් මැනීමේ කොමිසම සමඟ මිනින්දෝරුවරයා වෙත භාරදීමට අධිකරණය වෙත ඉදිරිපත් කරන දැන්වීමක් එකී 16 (3) සිට 16 (5) දක්වා වූ වගන්ති වලින් විස්තර කර ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව එකී පාර්ශවයන් වෙත භාර දිය යුතු වන අතර, ඒ යටතේ 16 (6) වගන්තියේ ප්‍රතිපාදන එම අය වෙත අදාල විය යුතුය.

ඒ යටතේ එකී ප්‍රතිපාදන බෙදුම් පනතේ 20 (1) (අ) වගන්තිය සමඟ එක්ව ගෙන කියවිය යුතු වන අතර, මක්නිසාද යත් 20 (1) (අ) වගන්තිය මුල් පනතේ වගන්තියක් වීමත් 1987 අංක 32 පනතින් කල සංශෝධන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 20 (1) (අ) වගන්තිය වෙතද අදාල විය යුතු වන බැවිනි.

7) බෙදුම් පනතේ 18 (3) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු අධිකාරි වෙත යොමුවිය හැක්කේ මූලික මැනීමට අදාල කොමසාරිස්වරයාගේ ක්ෂේත්‍ර සටහන්වල පිටපත හා පිඹුර ප්‍රයෝජනයට ගැනීමට පෙර ඒවා පරීක්ෂා කර බැලිය යුතු බවට නඩුවේ කිසියම් පාර්ශවයක් විසින් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවකදී පමණි. ඒ යටතේ

වන නෛතික ප්‍රතිපාදන බෙදුම් පනතේ 18 (3) (අ) සිට 18 (3) (උ) වගන්තිය දක්වා විස්තර වේ.

8) කිසියම් චිත්තිකරුවෙකු විසින් පැමිණිල්ලේ පෙලපත නොපිළිගන්නේනම් ස්වකීය හිමිකම් ප්‍රකාශය සමග තමන් විශ්වාසය තබන පෙලපත ඉදිරිපත් කර තිබිය යුතුය(බෙදුම් පනතේ 19 (1) (අ) වගන්තිය)

9) කිසියම් චිත්තිකරුවෙකු විසින් මූලික පිඹුරේ දක්වා ඇත්තේ විශාල ඉඩමක කොටසක් බවත් එකී විශාල ඉඩම බෙදිය යුතු බවටත් කරුණු දක්වා ඇති විට පනතේ 19 (2) (අ) සිට 19 (2) (උ) දක්වා ප්‍රතිපාදන අදාල වන අතර, ඒ අනුව අධිකරණය විසින් ඊට අදාලව පියවර ගත යුතුවේ.

10) බෙදුම් පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව දැන්වීම් ලද පාර්ශවයන් වෙත බෙදුම් පනතේ 69 වන වගන්තියේ විධි විධාන අදාල නොවේ.

11) බෙදුම් නඩුවකට අදාල ලේඛන ලැයිස්තුව සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන පනතේ 23 (1) වගන්තියෙහි සඳහන් වන අතර ලේඛන අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන පනතේ 23 (2) හා පනතේ 23 (3) වගන්තියෙහි සඳහන් වේ.

12) හිමිකම් ප්‍රකාශයක් ගොනුකර නොමැති පාර්ශවයක් පැහැර හැරි පාර්ශවයක් වශයෙන් සැලකිය යුතු වන අතර, ඇතැම් අවස්ථාවලදී සමහර පාර්ශවයන් වෙනුවෙන් තමන් පැමිණිල්ලේ පෙලපත සමඟ එකඟ බවට ප්‍රකාශ කරමින් හිමිකම් ප්‍රකාශ ගොනු නොකරන අවස්ථාවකදීද එම පාර්ශවයන්ද පැහැර හැරි පාර්ශවයක් බවට නිරායාසයෙන්ම පත්වේ.